ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය

2022 ජනවාරි 01 - 2022 දෙසැම්බර් 31

CM 039971 - 50 (2024/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,
අංක 155/15, කාසල් වීදිය,
බොරැල්ල, කොළඹ 08.

ගරු ජනමාධ්‍ය ඇමතිතුමා,
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
163, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

වාර්ෂික වාර්තාව - 2022

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 20 වැනි වගන්තිය සහ 1971 අංක 38 දරන මුද්‍රල් පනතේ 14 වැනි වගන්තිය අනුව ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පහත සඳහන් වාර්තා ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

01. 2022 ජනවාරි මස 01 වැනි දින සිට 2022 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා මණ්ඩලයෙන් ඉටු කෙරුණ කාර්යභාරය.

02. විගණකාධිපතිගේ වාර්තාව.

03. එම කාලපරිච්ඡේදය සඳහා අවසන් ගිණුම් ප්‍රකාශනයේ පිටපතක්.

මෙයට,
විශ්වාසී,

ජ්‍යෂ්ඨ කථිකාචාර්ය මහින්ද පතිරණ,
සභාපති.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2022

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

1973 අංක 5 දරන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය පිහිටුවීමේ පරමාර්ථය වූයේ,

ශ්‍රී ලංකාවෙහි පුවත්පත්වලට අදාළ කරුණු විධිමත් කිරීමට හා ඒ කරුණු සම්බන්ධයෙන් උපදෙස් දීමට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයක් පත් කිරීම සඳහා ද ඇතැම් කරුණු පුවත්පත්වල මුද්‍රණය කිරීමට හෝ පළ කිරීමට අදාළ වැරදි විමර්ශනය කිරීම සඳහා ද ඒවාට සම්බන්ධ හෝ අනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ආයතනයක් ලෙසය.

2012.01.01 දින සිට අංක 155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 08 ස්ථානයේ පවත්වාගෙන යනු ලැබීය.

1. මණ්ඩලයේ සැකැස්ම

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් හත්දෙනෙකුගෙන් (07) සමන්විත වේ. ඉන් එක් තැනැත්තෙකු පත්‍රකලා සංගම් නියෝජනය කරමින් පත් කරන අතර අනෙක් තැනැත්තා පුවත්පත් ව්‍යාපාරයේ සේවකයින්ගේ සබඳතා නියෝජනය කරන වෘත්තීය සමිති සාමාජිකයින්ගේ නියෝජිතත්වයෙන් පත් කරනු ලබයි. මෙම සාමාජිකයින් 07 දෙනාගෙන් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයා (වර්තමාන ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා) නිල බලයෙන් පත්වේ. පත් කරනු ලබන දින සිට සාමාජිකයන්ගේ නිල කාලය වසර 03 කි. පුවත්පත් කොමසාරිස්වරයා මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරනු ඇත.

අතිගරු ජනාධිපතිතුමන් විසින් 2020.01.08 වැනි දින සිට පත් කරන ලද මණ්ඩලයේ සභාපති හා සාමාජිකත්වයේ නාම ලේඛනය පහත පරිදි විය.

තනතුර	නම	පත්වූ දිනය
සභාපති	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහින්ද පතිරණ මහතා	2020.01.08
සාමාජික	දිනිත් චින්තක කරුණාරත්න මහතා (රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්) නිල බලයෙන්	
සාමාජික	නීතිඥ ගාමිණී විජේවර්ධන මහතා	2020.01.22
සාමාජික	ජනාධිපති නීතිඥ ප්‍රසන්ත ලාල් ද අල්විස් මහතා	2020.01.22
සාමාජික	ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතා	2020.01.22
සාමාජික	ආරියනන්ද දොඹගහවත්ත මහතා	2020.07.07
සාමාජික	කේ.ජී.සී.පී.බණ්ඩාර මහතා	2020.09.17

කේ.ඒ. රම්‍යා කාන්ති මෙනවිය ඉවත් වූ පසු 2022.03.03 දින සිට ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විගණන හා කළමනාකරණ කමිටුවේ භාණ්ඩාගාර නියෝජිත තනතුරට (නිරීක්ෂක) එස්. ගිරිදරන් මහතා පත් කරන ලදී.

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළ මොහාන් සමරනායක මහතා ඉවත් වූ පසු රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ලෙස දිනිත් චින්තක කරුණාරත්න මහතා 2022.09.08 දින සිට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා පත් කරන ලදී.

02. මණ්ඩලයේ රැස්වීම්

සභාපතිතුමාගේ හා සාමාජික මහතුන්ගේ ප්‍රධානත්වයෙන් මණ්ඩල රැස්වීම් 24 ක් 2022 වර්ෂය තුළ දී පැවැත්විණි.

03. කාර්ය මණ්ඩලය

වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව සකස් කරන ලද ආකෘතියට අනුව නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව කාර්ය මණ්ඩලය පහත පරිදි වේ :-

2022 වර්ෂයේ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 18 කි.

1. ටී. නිරෝෂණ මහතා	පුවත්පත් කොමසාරිස්
2. එම්.පී. කුෂාන් දේවප්‍රිය මහතා	ගණකාධිකාරි
3. සුරෝෂණ ඉරංග මහතා	සහකාර පුවත්පත් කොමසාරිස්
4. දිල්හානි විජේරත්න මිය	සහකාර පුවත්පත් කොමසාරිස්
5. කේ.ජී.එන්.එච්. පතිරත්න මිය	පරිපාලන නිලධාරි
6. එච්.එස්. විජේරත්න මිය	ප්‍රවෘත්ති විමර්ශක (සිංහල)
7. ශාලනි ඊ. ජේ. යෝගරාජා මෙනවිය	ප්‍රවෘත්ති විමර්ශක (දෙමළ)
8. කේ. ජී. තිලානි එම්. බණ්ඩාර මෙනවිය	ප්‍රවෘත්ති විමර්ශක (ඉංග්‍රිසි)
9. ටී.ඒ. අනෝමා ප්‍රියන්ති තිලකරත්න මිය	කළමනාකරණ සහකාර
10. ටී.එන්. නිල්මිණී පීරිස් මිය	ගිණුම් සහකාර
11. බී.එම්.පී.කේ. සිරිවර්ධන මිය	කළමනාකරණ සහකාර
12. ඒ.එස්. නෙරංජී මිය	කළමනාකරණ සහකාර
13. විදුරංගි වත්සලා මිය	කළමනාකරණ සහකාර
14. එච්.එස්.එස්. ආනන්ද මහතා	පණිවිඩකරු
15. ජී. ඉසුරු ධනංජය කරුණාතිලක මහතා	කාර්යාල කාර්ය සහයක

පහත නිලධාරීන් වසර තුළ සේවයෙන් ඉවත්ව යන ලදී.

1. එන්.ජේ.ඒ.ජේ.ජී. පෙරේරා මිය	කළමනාකරණ සහකාර (2022.02.05)
2. ජී.බී. කරුණාතිලක මහතා	රියැදුරු (2022.08.25)
3. කේ.ඒ. විනූෂි ශෂිකලා මිය	භාෂා පරිවර්තිකා (2022.10.21)

04. පැමිණිලි

2022 වර්ෂය තුළ දී ප්‍රවෘත්ති පත්‍රවලට විරුද්ධව පැමිණිලි 34 ක් ලැබී ඇත.
2022 වර්ෂයේ ලද පැමිණිලි හා පැමිණිලි විභාග වූ ආකාරය පහත පරිදි වේ.

2013 වසරේ සිට 2018 වසර දක්වා "ඊතලය" සඟරාවට එරෙහිව මණ්ඩලය මගින් අභියාචනාධිකරණයේ ගොනුකරන ලද පැමිණිලි 11 ක් වේ. (මෙම පැමිණිලි අභියාචනාධිකරණයේ සලකා බලමින් පවතී.)

විභාග වෙමින් පැවති පෙර වර්ෂයෙන් (2021)	
2022 වර්ෂය සඳහා ඉදිරියට ගෙනා පැමිණිලි	35
2022 වර්ෂය තුළ ලද පැමිණිලි	34
2022 වර්ෂයේ විභාග වූ මුළු පැමිණිලි	69

පැමිණිලි විභාග වූ ආකාරය

විධිමත් ආකාරයට යොමු නොකළ පැමිණිලි	08
විමර්ශන කටයුතු වෙමින් පවතින	23
ඉදිරි කටයුතු නොකිරීමට තීරණය කළ	17
නිෂ්ප්‍රභ කිරීම්	10
එකඟතාවයට පත්වූ	11
	69

මණ්ඩලය වෙත ලද මුළු පැමිණිලිවල මූලයන් පහත පරිදි බෙදා දැක්විය හැකිය.

1. පුද්ගලයන්, ජනතා නියෝජිතයින්
2. ආයතන ප්‍රධානීන් /අමාත්‍යාංශ ලේකම්වරුන්
3. කථිකාචාර්යවරුන්
4. වෛද්‍ය නිලධාරින්, වෙනත් වෘත්තිකයින්
5. පූජක පක්ෂය
6. විදුහල්පතිවරු, ගුරු මහත්ම මහත්මීන්
7. සමිති සමාගම්
8. විවිධ දේශපාලන පක්ෂ නායකයින්, කණ්ඩායම්

2022 වර්ෂයේ ලද පැමිණිලි 34 පහත දැක්වෙන පුවත්පත් අයිතිකරුවන්ට විරුද්ධව ඉදිරිපත් කර තිබුණි:-

<u>අයිතිකරුගේ නම</u>

1. සී.ස. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
2. සී.ස. උපාලි පුවත්පත් සමාගම
3. සී.ස. විජය පුවත්පත් සමාගම
4. ඊතලය පුවත්පත් ආයතනය
5. එක්ස්ප්‍රස් නිවුස් පේපර්ස් පුද්ගලික සමාගම
6. සිලෝන් නිව්ස් පේපර්ස් පුද්ගලික සමාගම
7. ලිබර්ටි පබ්ලිෂර් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම
8. වෙනත්

<u>පුවත්පත් ලියාපදිංචි කිරීම</u>

2022 වසරේ මණ්ඩලයේ ලියාපදිංචි පුවත්පත් සංඛ්‍යාව 147 ක් වේ.

05. අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට නිකුත් කරනු ලබන විධාන

සමාලෝචිත කාලය තුළ ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට නියෝග නිකුත් නොකළේය.

06. මාධ්‍යවේදීන්, ගුරුවරුන් හා සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්

2022 වර්ෂයේ දෙසැම්බර් මස දක්වා පවත්වන ලද වැඩමුළු, දේශන හා වැඩසටහන් පහත සඳහන් පරිදි වේ.

I. උසස් පෙළ "සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය" විෂය ඉගැන්වීමේ නියැලෙන ගුරුවරුන් සහ සිසුන් සඳහා පැවැත්වූ වැඩමුළු

- 2022.02.03 සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය හා විකාශය
- 2022.03.10 සන්නිවේදනය හැඳින්වීම හා එහි ස්වභාවය
- 2022.03.24 සන්නිවේදන මූලිකාංග හා එහි කාර්යයන්

II. Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලද කාලීන කතිකාව

- 2022.08.18 විරෝධතා දේශපාලනය හමුවේ ජනමාධ්‍ය භූමිකාව
- 2022.09.08 සමාජ ප්‍රවණතා හමුවේ ජනමාධ්‍ය නිදහස
- 2022.10.06 තොරතුරු දැනගැනීමේ අයිතිය හා ජනමාධ්‍යවේදියාගේ භූමිකාව
- 2022.10.27 අපරාධ වාර්තාකරණය හා ජනමාධ්‍යවේදියාගේ සමාජ වගකීම
- 2022.11.24 මාධ්‍ය වාර්තාකරණයේ භාෂා භාවිතයේ භූමිකාව

III. පාසල්/උපකාරක පන්ති සඳහා පවත්වන වැඩමුළු

- කඩවත සයන්ස් ඉමේජ් ආයතනය
- බප/කැල/බොල්ලෑගල මහා විද්‍යාලය
- ISK ආයතනය
- ගම්පහ මොන්ටානා ආයතනය

07. මාධ්‍ය අධ්‍යයනය හා පුවත්පත් කලාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2022 වසර

මාධ්‍ය අධ්‍යයනය හා පුවත්පත් කලාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ IX වන කණ්ඩායමේ (2021 ආරම්භ කළ) අධ්‍යයන කටයුතු මේ වන විටත් අවසන් කර නොමැත.

08. පුවත්පත් කලාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - 2022 වසර

"සහතික පත්‍ර පාඨමාලාව - II" වන කණ්ඩායම ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචි නොවූ බැවින් ලියාපදිංචි වී සිටි සිසුන් 20 දෙනෙකුට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව නැවත ලියාපදිංචි ගාස්තු ලබාදීමට කටයුතු කරන ලදී.

පාඨමාලාවේ විෂය නිර්දේශය පුවත්පත් කලාවට විශේෂිතව ආවරණය වූ බැවින් වත්මන් මාධ්‍ය ප්‍රවණතා පිළිබඳව ද අවධානය යොමු කර විද්‍යුත් මාධ්‍ය සහ සමාජ මාධ්‍ය පිළිබඳව ද ඇතුළත් වන පරිදි නැවත විෂය නිර්දේශය සංශෝධනය කර මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව II නමින් පාඨමාලාවට සිසුන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ අතර ඒ අනුව සිසුන් 06 දෙනෙකු පාඨමාලාව සඳහා ලියාපදිංචි විය.

09. සන්නිවේදන කතිකාවත - 2022 වසර

කාලීන වශයෙන් වැදගත් ප්‍රකාශනයන් ඉලක්ක කර සන්නිවේදන කතිකාවත නම් සාකච්ඡාමය වැඩසටහනක් සෑම මසකම දෙදිනක් පවත්වන ලදී. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ මෙම වැඩසටහන් 10 ක් පවත්වන ලදී.

- ස්මාර්ට් කුඹියාගේ වලාකුළු සවාරිය - නුවන් කුමාර කටුගම්පල මහතාගේ කෘතිය
- "නව ලෝකය" - වාම සන්නිවේදනයේ පූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර හිමි භූමිකාව - චන්දන විජේකෝන් මහතාගේ නවතම කෘතිය
- පිපාසයි ආනන්ද කුසිනාරාව තව දුරද? ඉරානි නිල්මිණි අබේකෝන් මියගේ කාව්‍ය සංග්‍රහය
- රවි ගී සැඳෑව - රසවින්දන වැඩසටහන - සංගීතඥ රවිශංකර් ෂර්මා පිළිබඳ වැඩසටහන
- වාසනා දිනේකි මේක - නාඩගම් හා නූර්ති ගී රසවින්දන වැඩසටහන
- "අනිච්ඡානුග හා පෙරිප්ලා" - කෙටි චිත්‍රපට පිළිබඳ වැඩසටහන
- ගහකටත් වරිපනම් අංකයක් - අනුර බී. සෙනවිරත්න මහතාගේ නවතම කෘතිය
- "පැහැනද පහන්" - සුනන්ද කරුණාරත්න මහතාගේ කාව්‍ය කෘතිය
- ගී පද සංකල්පනා වැඩසටහන
- ගී පැදුර වැඩසටහන

10. මුදල්

I 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් රු. 35,200,000/- ක මුදලක් ජනමාධ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ අනුමත කරන ලදී. මෙම මුදලම මණ්ඩලයේ වියදම් සඳහා වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයෙන් මාසික වාරික වශයෙන් ලබා ගන්නා ලදී.

II 2022 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රු. 3,000,000/- ක මුදලක් මහා භාණ්ඩාගාරයේ වැය ශීර්ෂය යටතේ අනුමත කළ අතර මෙම මුදලින් රු. 2,422,000/- ක මුදලක් මණ්ඩලයේ ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා භාවිතා කරන ලදී.

III රජයේ දායකය සහ පුවත්පත් ලියාපදිංචි කිරීමේ ගාස්තු හැරුණු විට 2022 වර්ෂය තුළදී මණ්ඩල අරමුදලට බැර කරන ලද ලැබීම් මෙසේය.

වෙනත් ලැබීම් (විලම්හිත ආදායම හැර)	රු.	709,535.47
ප්‍රමාද ගාස්තු ආදායම්	රු.	136,000.00
		845,535.47
		========

IV <u>මූල්‍ය කාර්ය සාධන වාර්තාව</u>

පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය ද ඇතුළුව වර්ෂය තුළ මුළු ආදායම රු. 38,713,504.77 ක් වූ අතර මුළු වියදම රු. 37,060,232.50 ක් විය. වර්ෂය සඳහා අතිරික්තය රු. 1,653,272.27 ක් 2022 වර්ෂයේ දී මණ්ඩල අරමුදලට බැර කරන ලදී.

V <u>මණ්ඩල සමුච්චිත අරමුදල</u>

2022 වර්ෂය ආරම්භයේ දී මණ්ඩල අරමුදලේ බැර ශේෂය රු. 8,901,743.40 කි. වර්ෂය ආරම්භයේ ප්‍රාග්ධන අරමුදලේ ශේෂය රු. 982,406.97 කි. වර්ෂය තුළදී ප්‍රාග්ධන වත්කම් මිලට ගැනීම සඳහා ලද මුදල රු. 2,422,000/- කි. වර්ෂය සඳහා ප්‍රාග්ධන ක්‍රමක්ෂය රු. 2,110,273.30 කි. මෙම වසරේ ප්‍රාග්ධන අරමුදලේ ශේෂය රු. 1,294,133.67 ක් විය. වර්ෂය තුළ වියදම ඉක්ම වූ අතිරික්තය රු. 1,653,272.27 ක් සහ කලින් වර්ෂයට ගැලපුම් වෙනුවෙන් රු. 600,298.16 ක් මණ්ඩල අරමුදලට

මාරු කිරීමෙන් පසු වර්ෂය අවසානයේ මණ්ඩල සමුච්චිත අරමුදලේ බැර ශේෂය රු. 9,954,717.51 ක් විය.

මණ්ඩල සමුච්චිත අරමුදලේ බැර ශේෂය ද, ප්‍රාග්ධන අරමුදලේ බැර ශේෂය ද, පාරිතෝෂික අරමුදල සඳහා වෙන්කිරීම් වන රු. 4,746.257.50 ක් සහ ප්‍රවර්තන බැරකම් වන රු. 738,738.05 ක්ද ඇතුළුව මුළු වගකීම් ප්‍රමාණය ස්ථාවර වත්කම් වන රු. 8,239,870.26 ක් ණය අරමුදල් ශේෂය රු. 4,239,588.99 ක් හා ප්‍රවර්තන වත්කම් රු. 10,303,544.20 ක් මගින් නියෝජනය වේ.

VI <u>පුවත්පත් ලියාපදිංචි කිරීම</u>

2022 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා පුවත්පත් ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් රු. 532,000/- ක් ලැබුණි.

11. ස්තුතිය

මුදල් අමාත්‍යාංශයෙන් ලැබුණු නිවැරදි උපදෙස් සහ සහයෝගය මෙන්ම වගකීම් හා යුතුකම් ඉටු කිරීමේදී ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල කාර්ය මණ්ඩලයේ සියලුදෙනා විසින් දක්වන ලද ඇප කැපවීම ද අගය කරමි.

ජ්‍යෂ්ඨ කථිකාචාර්ය මහින්ද පතිරණ,
සභාපති.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය,
155/15, කාසල් වීදිය,
බොරැල්ල, කොළඹ 08.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය		2022	2021
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)	සටහන		
ආදායම		රු.	රු.
ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන	3	35,200,000.00	28,665,000.00
පුවත්පත් ලියාපදිංචි ගාස්තු		532,000.00	504,000.00
පිටපත් ගාස්තු		17,920.00	1,500.00
ප්‍රමාද ගාස්තු		136,000.00	10,500.00
විවිධ තැන්පතු / ආදායම්	4	2,135,969.30	2,587,162.83
පොත් අලෙවිය	5	(29,884.50)	6,330.00
ඩිප්ලෝමා පාඨමාලා / සහතික පත්‍ර ආදායම		466,500.00	473,500.00
පොළී ආදායම - කාර්යමණ්ඩල ණය		137,483.50	106,017.31
පොළී ආදායම - ඉතුරුම් ගිණුම්		117,516.47	167,716.55
මුළු ආදායම		**38,713,504.77**	**32,521,726.69**
වියදම්			
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ	6	23,923,160.11	21,260,061.36
සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	7	794,756.68	939,782.01
දේපල පිරියත සහ උපකරණ ක්ෂයවීම්,	16	2,530,981.74	2,947,239.86
උපයෝගිතා වියදම්	8	5,983,693.13	5,335,628.76
වෙනත් මෙහෙයුම් වියදම්	9	2,640,847.14	3,370,321.42
ප්‍රදාන සහ හුවමාරු ගෙවීම්	10	1,186,793.70	2,049,866.00
මුළු වියදම්		**37,060,232.50**	**35,902,899.41**
බදු පෙර අතිරික්තය/(හිඟය)		**1,653,272.27**	**(3,381,172.73)**
ආදායම් බදු වියදම්		-	-
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)		**1,653,272.27**	**(3,381,172.73)**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

	සටහන	2022	2021
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	11	3,605,249.91	2,797,631.03
ලැබිය යුතු ආදායම්	12	238,370.00	243,870.00
තොග	13	876,512.54	989,959.76
තැන්පතු සහ කලින් ගෙවීම්	14	1,210,911.75	1,138,622.70
ලැබිය යුතු ආපදා ණය	15	3,917,500.00	2,603,033.50
ලැබිය යුතු කෙටිකාලීන ණය	15.1	455,000.00	-
		10,303,544.26	**7,773,116.99**
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ	16	8,239,870.26	8,341,636.49
ආයෝජන - ඉතුරුම් ගිණුම් (අරමුදල් වෙනුවෙන්)	17	4,239,588.99	5,840,839.02
		12,479,459.25	**14,182,475.51**
මුළු වත්කම්		**22,783,003.45**	**21,955,592.50**
වගකීම්			
ජංගම වගකීම්			
විවිධ ණයහිමියෝ		2,000.00	2,000.00
උපචිත වියදම්	18	736,738.05	1,398,447.91
		738,738.05	**1,400,447.91**
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	19	4,746,257.50	4,621,837.50
හඳුන්වාදුන් ප්‍රාග්ධනය		1,294,133.67	982,406.97
		6,040,391.17	**5,604,244.47**
මුළු වගකීම්		**6,779,129.22**	**7,004,692.38**
ශුද්ධ වත්කම්		**16,003,874.23**	**14,950,900.12**
ශුද්ධ වත්කම් / කොටස් ප්‍රාග්ධනය			
ප්‍රාග්ධන සංචිත		4,115,000.00	4,115,000.00
ප්‍රත්‍යාගනන සංචිත		1,934,156.72	1,934,156.72
සමුච්චිත අතිරික්ත /(හිඟ)		9,954,717.51	8,901,743.40
		16,003,874.23	**14,950,900.12**

පිටු අංක 06 සිට 19 දක්වා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි අත්‍යවශ්‍ය කොටසක් වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇත.

.....,
සකස් කළේ
ගණකාධිකාරී
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ සියලු වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලක මණ්ඩලය සතුවේ.
පාලක මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

.....
පුවත්පත් කොමසාරිස්
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

.....
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

.....,
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

.....,
සභාපති
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

2023 පෙබරවාරි මස 21 වැනි දින

	දායක ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිතය	ප්‍රත්‍යාගනන සංචිතය	සමුච්චිත අතිරික්ත /(හිඟය)	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**838,569.79**	**4,115,000.00**	**1,934,156.72**	**12,239,016.13**	**19,126,742.64**
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් / වැරදි නිවැරදි කිරීම් (සටහන A)	-	-	-	43,900.00	43,900.00
භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්	2,731,000.00	-	-	-	2,731,000.00
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සංචිතය	-	-	-		-
රජයේ දායකය ප්‍රාග්ධන ගිණුමට බැර කිරීම (ක්‍රම ක්ෂය සඳහා)	(2,587,162.83)	-	-	-	(2,587,162.83)
වර්ෂය සඳහා අතිරික්ත/(හිඟය)	-	-	-	(3,381,172.73)	(3,381,172.73)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**982,406.97**	**4,115,000.00**	**1,934,156.72**	**8,901,743.40**	**15,933,307.09**
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් / වැරදි නිවැරදි කිරීම් (සටහන B)	-	-	-	(600,298.16)	(600,298.16)
භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්	2,422,000.00	-	-	-	2,422,000.00
රජයේ දායකය ප්‍රාග්ධන ගිණුමට බැර කිරීම (ක්‍රම ක්ෂය සඳහා)	(2,110,273.30)	-	-	-	(2,110,273.30)
වර්ෂය සඳහා අතිරික්ත/(හිඟය)	-	-	-	1,653,272.27	1,653,272.27
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,294,133.67**	**4,115,000.00**	**1,934,156.72**	**9,954,717.51**	**17,298,007.90**

සටහන් A - ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් / වැරදි නිවැරදි කිරීම්	රු.
පුවත්පත් ලියාපදිංචි ගාස්තු 2021	14,000.00
විගණන ගාස්තු වැඩියෙන් වෙන් කිරීම් 2021	53,200.00
වෙබ් අඩවි ලියාපදිංචි ගාස්තු 2021	(23,300.00)
	43,900.00

සටහන් B - ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් / වැරදි නිවැරදි කිරීම්	
පුවත්පත් ලියාපදිංචි ගාස්තු 2022	8,000.00
2021 වර්ෂයේ උපචිත වියදම් මණ්ඩල අරමුදල වැරැදියට ගැලපීම	(17,563.75)
2021 දෙසැම්බර් මස සභාපතිතුමාගේ වැටුප් ගැලපීම	(401,730.00)
පාසල් උපකරණ තොග ගැලපීම	72,330.08
කාර්යය මණ්ඩල පුහුණු දීමනා ගෙවීම නැවත ලැබීම ගැලපීම	20,000.00
ක්ෂයවීම් - කාර්යාලයීය ලී බඩු හා සවිකිරීම් ආරම්භක ශේෂය නිවැරදි කිරීම	2,148.01
ආපදා ණය ආරම්භක ශේෂය නිවැරැදි කිරීම ගැලපීම	(86,783.50)
පත්තර ලියාපදිංචි සහ ප්‍රමාද ගාස්තු ගැලපීම	(189,500.00)
2021 වර්ෂයට අදාළ විගණන ගාස්තු අඩුවෙන් වෙන් කිරීම් ගැලපීම	(7,200.00)
2021 වර්ෂයේ උපචිත වියදම් මණ්ඩල අරමුදල වැරදියට ගැලපීම	1.00
	(600,298.16)

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය		**2022**	**2021**
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)	**Note**		
		රු.	රු.
වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)		1,653,272.27	(3,381,172.73)
ගැලපුම්			
ක්ෂයවීම්		2,530,981.74	2,947,239.86
කපාහැරීම්		-	-
පෙර වර්ෂයේ ගැලපුම්		(600,298.16)	43,900.00
ප්‍රවර්ථන වර්ෂයේ පාරිතෝෂික වෙන් කිරීම්		1,275,747.50	258,211.50
ක්ෂය ගැලපීම නිවරදි කිරීම		(2,148.01)	-
ප්‍රාග්ධන ක්‍රම ක්ෂය		(2,110,273.30)	(2,587,162.83)
මෙම වසරේ පොලී ආදායම්		(117,516.47)	(167,716.55)
කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභ		**2,629,765.57**	**(2,886,700.74)**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්			
ලැබිය යුතු ආදායම් (වැඩිවීම්) / අඩුවීම්		5,500.00	(48,000.00)
තොග (වැඩිවීම්) / අඩුවීම්		113,447.22	(361,072.75)
තැන්පතු සහ කලින් ගෙවීම් (වැඩිවීම්) / අඩුවීම්		(72,289.05)	(44,839.28)
ලැබිය යුතු ආපදා ණය (වැඩිවීම්) / අඩුවීම්		(1,314,466.50)	217,268.25
කෙටිකාලීන ණය (වැඩිවීම්) / අඩුවීම්		(455,000.00)	-
විවිධ ණයහිමියන්ගේ වැඩිවීම් / (අඩුවීම්)		-	(5,000.00)
උපචිත වියදම්වල වැඩිවීම් / (අඩුවීම්)		(661,709.86)	533,713.99
මෙහෙයුම්වලින් ජනනය වූ මුදල්		**245,247.38**	**(2,594,630.53)**
මෙහෙයුම්වලින් ජනනය වූ මුදල්			
ගෙවූ පාරිතෝෂික		(1,151,327.50)	(431,016.50)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(906,080.12)**	**(3,025,647.03)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
මිළදී ගත් ස්ථාවර වත්කම්		(2,427,067.50)	(2,892,575.00)
අරමුදල්වල ආයෝජන		1,601,250.03	(491,002.11)
පොලී ආදායම්		117,516.47	167,716.55
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලාඒම් / (ගලායාම්)		**(708,301.00)**	**(3,215,860.56)**
මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය			
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන /:වෙත කරන ලද ආපසු ගෙවීම්)		2,422,000.00	2,731,000.00
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලාඒම් / (ගලායාම්)		**2,422,000.00**	**2,731,000.00**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වර්ධනය / අඩුවීම		**807,618.88**	**(3,510,507.59)**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		**2,797,631.03**	**6,308,138.62**
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**3,605,249.91**	**2,797,631.03**

1 පොදු කරුණු

1973 අංක 5 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය අංක 155/15, කාසල් වීදිය, බොරැල්ල, කොළඹ 08 යන ලිපිනයෙහි සිය ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන සේවා ස්ථානය පවත්වාගෙන යනු ලබයි.

1.1 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය .

පුවත්පත් නිදහස ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය උදෙසා වන සංස්කෘතිකාංගයක් ලෙස ප්‍රචලිත කිරීම ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යයයි.

1.2 ගිණුම් වාර්තා සැකසීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී භාවිත කළ ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දක්වා ඇත. විශේෂයෙන් සඳහන් කර නොමැති නම් එම ප්‍රතිපත්තීන් ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇති සෑම වර්ෂයකදීම භාවිත කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (ICASL) විසින් ඒකාබද්ධව ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය ආයතන සඳහා වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුව සකස්කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි.

1.3 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුව සකස් කර ඇත.

1.4 අඛණ්ඩභාවය

මණ්ඩලයට නුදුරු අනාගතය තුළ තම මෙහෙයුම් පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් ඇති බවට පාලක මණ්ඩලය සෑහීමකට පත්වේ. එබැවින් අඛණ්ඩභාවය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.

1.5 සන්සන්දනාත්මක තොරතුරු

මණ්ඩලය නියත වශයෙන්ම ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත්තේ ආයතනය විසින් අඛණ්ඩව භාවිත කර ඇති පෙර වර්ෂයන්හි භාවිත කළ ප්‍රතිපත්ති හා අනුකූලව වේ. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සෑම අවස්ථාවකදීම පසුගිය වර්ෂයේ සංඛ්‍යා සම්බන්ධ කර ගෙන තිබේ.

1.6 යෝග්‍ය බව සහ සමූහනය

සමාන අයිතම කාණ්ඩයන් මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇති අතර අසමාන අයිතම හෝ කාර්යයන් අදාළ වේ නම් පමණක් වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

1.7 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර මූල්‍ය වර්ෂයන්හි භාවිත කළ ප්‍රතිපත්ති හා අනුකූල වේ.

2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සෑම කාල සීමාවකටම අදාළ කර ගෙන ඇත.

2.1 දේපළ, යන්ත්‍ර සහ උපකරණ

2.1.1 හඳුනා ගැනීම සහ ප්‍රමාණනය

මෝටර් රථ හැර සියලුම යන්ත්‍ර සහ උපකරණ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානි සඳහාවන අගයන් අඩුකිරීමෙන් පසු දක්වා ඇත. ප්‍රත්‍යාගනන දින වන විට මෝටර් රථවල සාධාරණ අගය ඒවායේ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිවල අගයන්ට වඩා අඩු බැවින් ඒවා ප්‍රත්‍යාගනන අගයට සටහන් කර ඇත. දේපළ, යන්ත්‍ර සහ උපකරණවල පවතින අගයන් අයකරගත නොහැකි බව පෙන්නුම් කරන අවස්ථාවන්හි දී ඒවා විය හැකි හානි සඳහා සමාලෝචනය කරනු ලැබේ. සියලුම දේපළ, යන්ත්‍ර සහ උපකරණ අයිතමයන් මූලිකවම පිරිවැය මත වාර්තා කර ඇත. දේපළ,

යන්ත්‍ර සහ උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කරන අවස්ථාවන්හි දී සම්පූර්ණ කාණ්ඩයම සාධාරණ අගය මත ප්‍රත්‍යාගණනය කර ඇත. ප්‍රත්‍යාගණනයන් නිසි පරිදි කලින් කලට සිදුකර ඇත. වත්කමක් ප්‍රත්‍යාගණනය කරන අවස්ථාවේ දී පවතින අගයෙහි සිදුවන වැඩිවීමක් සෘජුවම ප්‍රත්‍යාගනන සංචිතයට බැර කරනු ලැබේ. අදාළ වත්කමෙහි පූර්ව අතිරික්තය ඉක්මවන ප්‍රත්‍යාගණන හිඟයක් ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තය ඉදිරියේ සටහන් කෙරෙන අතර ඕනෑම අතිරික්තයක් වියදමක් ලෙස හඳුනා ගැනේ. වත්කම් බැහැර කිරීමේදී විකුණන වත්කම්වලට අදාළ ප්‍රත්‍යාගණන සංචිතයක් රඳවාගත් ඉපයුම්වලට මාරු කරනු ලැබේ. දේපළ, යන්ත්‍ර සහ උපකරණවලින් තවදුරටත් ආර්ථික වාසි බලාපොරොත්තු නොවන අවස්ථාවන්හි දී එම අයිතමයන් ප්‍රතිස්ථාපනය හෝ බැහැර කිරීම මගින් ඉවත් කරනු ලැබේ. එම වත්කම ඉවත්කිරීමෙන් ලද ලාභ හෝ පාඩු අදාළ වත්කම ඉවත් කළ වසරේ ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර ඇත.

2.1.2 ක්ෂයවීම්

නිරවුල් ඉඩම් හැර සියලුම දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ සඳහා ඒවායේ ඇස්තමේන්තුගත සළුල ආර්ථික කාලය පුරා කපා හැරෙන ලෙසට සෘජු ක්‍රමයක් භාවිතයෙන් පිරිවැය හෝ තක්සේරුව මත ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත. වත්කම්වල ඇස්තමේන්තුගත සළුල කාලය පහත පරිදි වේ.

වත්කම් වර්ගය	**වසර**
මෝටර් රථ - (10%)	10
ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් - (20%)	05
කාර්යාල උපකරණ - (20%)	05
පරිගණක උපකරණ (20%)	05
පුස්තකාල පොත් - (20%)	05

වත්කම්වල සළුල කාලය සහ ශේෂ වටිනාකම සමාලෝචනය කෙරෙන අතර අවශ්‍ය නම් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ ගැළපුම් සිදු කෙරේ. වත්කම භාවිතයට ගත් දිනයේ සිට ක්ෂය ගිණුම්ගත කිරීම මණ්ඩලයේ ප්‍රතිපත්තිය වේ.

2.2 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ යන්නෙන් ඉක්මනින් මුදල් බවට පත් කළ හැකි සහ වටිනාකමේ වෙනස්වීම්වලට භාජනය වීම ඉතා අඩු එනම්, අතැති මුදල්, ඉල්ලුම් තැන්පතුව සහ ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් කෙටිකාලීන ආයෝජන අර්ථ නිරූපණය කෙරේ.

2.3 ආයෝජන

ආයෝජන ඉතුරුම් තැන්පතුවලින් සමන්විත වන අතර මෙම ආයෝජන පිරිවැය මත ගිණුම්තබා ඇත.

2.4 තොග ලේඛනය

තොගය, ප්‍රකාශන සහ ලිපිද්‍රව්‍යවලින් සමන්විත වේ. ප්‍රකාශන ගිණුම් තැබීම සිදු කරනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගයට වේ.

2.5 වෙනත් ලැබීම්

වෙනත් ලැබීම් ලබාගැනීමට අපේක්ෂිත වටිනාකමට සඳහන් කර ඇත. ඩිප්ලෝමා පාඨමාලාවෙන් ලැබියයුතු මුදල් හැර වෙනත් සියලු ලැබීම් උපචිත පදනම මත ගිණුම් තබා ඇත.

2.6 වගකීම් සහ ප්‍රතිපාදන

අතීත සිදුවීමක් තුළින් වර්තමාන බැඳීමක් පැනනගින අවස්ථාවල සහ එය ඉටුකිරීම තුළින් ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත්වල ගලායාමක් බලාපොරොත්තුවන අවස්ථාවල දී ශේෂ පත්‍රය තුළ වගකීම් ඇතුළත් කෙරේ. ණය හිමියාගේ ඉල්ලීම මත හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් තුළ ගෙවා නිම කළ යුතු බැඳීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස දක්වා ඇත. ශේෂ පත්‍ර දිනයේ සිට වසරකට පසු ගෙවා නිම කළ හැකි වගකීම් ජංගම නොවන වගකීම් ලෙස සළකනු ලැබේ.

සමාගමට පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ අනුමිත වගකීමක් ඇති විට සහ එම වගකීම ඉටු කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලායාම පිළිබඳ පිළිගත හැකි ඇස්තමේන්තුවක් සිදුකළ යුතු අවස්ථාවකදී ශේෂ පත්‍රය තුළ ප්‍රතිපාදනයක් ඇතුළත් කෙරේ.

2.7 සේවක ප්‍රතිලාභ

2.7.1 නිශ්චිත දායක සැලසුම්

මණ්ඩලයේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙහි සාමාජිකයන් වන අතර මණ්ඩලය විසින් එම අරමුදල් සඳහා සේවකයන්ගේ මූලික වැටුපෙන් පිළිවෙලින් 15% ක් සහ 3% ක් වශයෙන් දායක මුදල් ගෙවනු ලැබේ.

2.7.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

පාරිතෝෂික නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් වේ. පනතට අනුකූල කාලසීමාව තුළ ගෙවීම් කිරීමට මණ්ඩලය නිත්‍යානුකූලව බැඳී සිටී. නිසි පරිදි යෝග්‍ය ලෙස වෙන් කරන ලද ඉදිරියට ගෙන යන මෙම වගකීම මූල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කර ඇත. පාරිතෝෂික ගණනය කරනු ලබන පදනම වන්නේ එක් එක් පුද්ගලයා ප්‍රවර්තන වර්ෂයේ අවසාන මාසයේ ගන්නා ලද වැටුපෙන් අඩක වටිනාකම එක් ලිත් වර්ෂයක් සඳහා වන පරිදි කරන ලද සේවා කාලයෙන් ගුණ කිරීමෙනි. ආයතනයෙන් ඉල්ලා අස්වූ විගසම මෙම මුදල ලබා ගැනීම සෑම දෙනෙකුගේම අපේක්ෂාව වේ. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරියට ගෙන එන ලද වෙන් කිරීම්, වර්ෂයේ ගෙවීම්, ඉදිරියට ගෙන යන වෙන් කිරීම් අතර වෙනස ආදායම් වියදම් ගිණුමෙන් ගලපනු ලැබේ. පාරිතෝෂික වගකීම ආයු ගණනය අගය කර නැති අරමුදලක් නොවේ.

2.8 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

2.8.1 ආදායම් හඳුනාගැනීම

ආයතනයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන සහ ආදායම හා ඒ වෙනුවෙන් දරනු ලැබූ හෝ දැරීමට නියමිත ආශ්‍රිත පිරිවැය සත්‍ය ලෙසම ගණනය කළ හැකි අවස්ථාවන්හි දී එය ආදායමක් ලෙස හඳුනා ගැනේ. ආදායම ගණනය කිරීම ලැබූ හෝ ලැබීමට නියමිත ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ අගය, වෙළෙඳ වට්ටම් සහ වෙළෙඳ බදු මත සිදු කෙරේ.

2.8.2 රජයේ දායකත්වය

රජයේ දායකත්වය මතුපිටින් පෙනෙන ලැබීමක් පමණක් ලෙස මූල්‍ය ප්‍රකාශන වලින් හඳුනාගැනෙන අතර ශේෂ පත්‍රයෙහි ජංගම නොවන වගකීමක් ලෙස හා විලම්බිත ආදායමක් ලෙස පෙන්නුම් කෙරේ. දරන ලද වියදමේ හිමිකමට එරෙහි රජයේ දායකය සහ ප්‍රයෝජනයට නොගන්නා අගය ශේෂ පත්‍රයෙන් පෙන්නුම් කෙරේ.

රජයේ දායකයට සම්බන්ධ දේපල, පිරියත සහ උපකරණ ආදායමෙන් වෙන් කරන ලද ක්‍රමානුකූල පදනමට පහත පරිදි සරල මාර්ග ක්‍රමයට ගණනය කරනු ලැබේ.

මෝටර් රථ	10%
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	20%
කාර්යාල උපකරණ	20%
පරිගණක උපකරණ	20%
පුස්තකාල පොත්	20%

2.8.3 පොලී ආදායම

පොලී ආදායම ලාභයේ දී හෝ පාඩුවේ දී උපචිත වන විට ඵලදායී පොලී ක්‍රමය මගින් හඳුනා ගැනීම සිදු කෙරේ.

2.8.4 වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

2.8.5 වියදම් හඳුනා ගැනීම

මණ්ඩලයේ ඒදිනෙදා මෙහෙයුම් කටයුතු සහ දේපළ, යන්ත්‍ර සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් නඩත්තු කිරීම සඳහා දරන ලද සියලු වියදම් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් කර ඇත.

2.8.6 වියදම් වර්ගීකරණය

මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ දී වියදමෙහි ස්වභාවය මත කරන වර්ගීකරණය මගින් මණ්ඩලයෙහි කාර්යසාධන මූලිකාංග වඩා හොඳින් ඉදිරිපත් වන්නේයැයි පාලක මණ්ඩලය අදහස් කළ හෙයින් එම ක්‍රමය භාවිත කරන ලදී.

2.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී වක්‍ර ක්‍රමය භාවිත කර ඇත.

2.10 වාර්තා කිරීමේ කාලයට පසු සිදු වූ සිදුවීම්

වාර්තා කිරීමේ කාලයට පසු සිදු වූ සිදුවීම් යනු වාර්තා කිරීමේ කාලසීමාවේ අවසන් දිනයත් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලැබෙන දිනයත් අතර සිදුවන යහපත් හෝ අයහපත් සිදුවීම් වේ. වාර්තා කිරීමේ කාලයට පසු සිදු වූ සිදුවීම්වල උපචිත බව සලකා බලා අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනයට ගැළපුම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිත .....)
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

	2022	2021
	රු.	රු.
සටහන 3 - ශ්‍රී ලංකා රජයෙන් ලද දායකත්වය	**35,200,000.00**	**28,665,000.00**
ශ්‍රී ලංකා රජයෙන් උපයෝගිතා සහ නඩත්තු සඳහා ලද ප්‍රතිපාදන නියෝජනය වේ.		
සටහන 4 - වෙනත් ආදායම්		
රජයේ දායකයෙන් ප්‍රාග්ධන ක්‍රම ක්ෂය	2,110,273.30	2,587,162.83
පාසල් වැඩසටහන් ආදායම්	10,400.00	-
භාණ්ඩ වෙන්දේසි විකුණුම් ආදායම්	15,250.00	-
RTI පිටපත් ගාස්තු	46.00	
	2,135,969.30	**2,587,162.83**
සටහන 5 - පොත් අලෙවිය		
පොත් විකුණුම්	176,420.00	31,500.00
අඩු කළා - පොත් විකුණුම් පිරිවැය	(206,304.50)	(25,170.00)
	(29,884.50)	**6,330.00**
සටහන 6 - වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ		
වැටුප් සහ වේතන	16,575,396.05	15,237,011.07
සේ.අ.අරමුදල් දායකත්වය	1,772,196.90	1,652,016.75
සේ.හා.අරමුදල් දායකත්වය	354,439.40	330,403.45
අතිකාල සහ නිවාඩු දින වැටුප්	449,398.90	571,482.92
අධ්‍යක්ෂක මණ්ඩල දීමනා	786,000.00	834,000.00
පාරිතෝෂික ප්‍රතිපාදන	1,275,747.50	258,211.50
විගණන කමිටු රැස්වීම් ගාස්තු	87,092.00	54,000.00
වෙනත් දීමනා	35,200.91	272,039.24
ඉන්ධන දීමනා	1,168,688.45	529,200.00
ප්‍රවාහන දීමනා	1,200,000.00	1,200,000.00
දුරකථන දීමනා	219,000.00	321,696.43
	23,923,160.11	**21,260,061.36**
සටහන 7 - සැපයුම් සහ අවශ්‍යතා		
ලිපිද්‍රව්‍ය	50,785.55	84,845.91
ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය	396,447.55	569,548.24
ඉන්ධන දීමනාව	-	-
කාර්යාල අවශ්‍යතා	181,513.58	204,067.86
නිල ඇඳුම්	12,000.00	12,000.00
පුවත්පත් සහ වාර සඟරා	154,010.00	69,320.00
	794,756.68	**939,782.01**
සටහන 8 - උපයෝගිතා වියදම්		
දුරකථන ගාස්තු	198,435.14	225,252.40
දුරකථන දීමනා	-	-
තැපැල්	27,355.00	21,120.32
විදුලිය	596,433.33	511,002.00
කාර්යාල කුලී	4,026,000.00	3,660,000.00
ජල ගාස්තු	154,130.16	103,747.04
ආරක්ෂක වියදම්	840,814.50	748,980.00
අනුපාත හා බදු	140,525.00	65,527.00
	5,983,693.13	**5,335,628.76**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිත .....)
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

	2022	2021
සටහන 9 - වෙනත් මෙහෙයුම් වියදම්		
ගමන් වියදම් - නිලධාරී	570.00	56,960.00
ගමන් වියදම් - සාමාජික	95,688.00	55,104.00
දැන්වීම් සහ ප්‍රකාශන	27,424.60	65,705.04
මුද්‍රණ සහ පොත් බැඳීම්	53,571.63	445,410.90
පරිවර්තන	10,065.00	26,130.00
අළුත්වැඩියා සහ නඩත්තු	1,219,269.70	1,101,891.73
සංග්‍රහ වියදම්	234,103.25	167,295.00
තාක්ෂණික ඇගයීම් කමිටු දීමනා	480.00	4,380.00
පොත් තොග කපාහැරීම්	76,384.00	-
විගණන ගාස්තු	654,000.00	646,800.00
අනියම් වියදම්	8,900.00	478,924.28
බැංකු ගාස්තු	2,770.00	4,860.00
මෝටර් රථ රක්ෂණ සහ බලපත්‍ර	187,120.96	180,960.47
නීති ගාස්තු	42,000.00	37,600.00
වෙබ් අඩවි වියදම්	28,500.00	98,300.00
	-	-
	2,640,847.14	**3,370,321.42**
සටහන 10 - ප්‍රදාන සහ මාරුකිරීම්		
පළාත් සන්නිවේදන වැඩමුළුව	82,400.00	191,170.00
ඩිප්ලෝමා පාඨමාලාව	742,527.91	212,865.00
සහතික පත්‍ර පාඨමාලාව	172,465.76	23,970.00
සංනිවේදන කතිකාවත	81,464.00	24,890.00
ප්‍රකාශන හා පර්යේෂණ	63,146.00	1,274,700.00
රචනා තරගය	-	9,540.00
පුහුණු පාඨමාලාව - නිලධාරී	-	77,500.00
වෙනත් වැඩසටහන්	9,370.00	175,073.00
ජනමාධ්‍යවේදී සුබසාධන පහසුකම්	-	52,230.00
පරිත්‍යාග	35,420.03	7,928.00
	1,186,793.70	**2,049,866.00**

	2022	2021
	රු.	රු.
සටහන 11 - මුදල් සහ මුදල් සමාන දෑ		
බැංකුවේ මුදල්	3,605,249.91	2,797,631.03
	3,605,249.91	**2,797,631.03**
සටහන 12 - වෙනත් ජංගම වත්කම්		
පොත් අලෙවිය	48,370.00	36,370.00
පුවත්පත් ලියාපදිංචි ගාස්තු	117,000.00	104,000.00
පුවත්පත් ලියාපදිංචි ප්‍රමාද ගාස්තු	73,000.00	103,500.00
	238,370.00	**243,870.00**
සටහන 13 - තොග ලේඛනය		
පොත් තොග	330,101.85	668,030.38
ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා තොග	356,214.51	223,883.28
විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත භාණ්ඩ තොග	117,866.10	98,046.10
පාසල් උපකරණ තොග	72,330.08	-
	876,512.54	**989,959.76**
සටහන 14 - තැන්පතු සහ අත්තිකාරම්		
ආරක්ෂක තැන්පතුව - කාසල් වීදිය ගොඩනැගිල්ල	831,600.00	831,600.00
ආරක්ෂක තැන්පතුව - ජල බෝතල්	12,200.00	12,200.00
ඉන්ධන තැන්පතුව	100,000.00	75,000.00
රක්ෂණ සහ ආදායම් සහතික ගාස්තු	257,111.75	209,822.70
ආපසු ගෙවීමේ තැන්පතු මුදල්	10,000.00	10,000.00
එකතුව	**1,210,911.75**	**1,138,622.70**
සටහන 15 - ලැබිය යුතු ආපදා ණය		
වර්ෂය ආරම්භයේ ශේෂය	2,603,033.50	2,820,301.75
ආරම්භක ශේෂ ගැලපීම	(86,783.50)	-
වර්ෂය තුළ ලබා දුන් ණය	2,975,000.00	303,750.00
	5,491,250.00	3,124,051.75
වර්ෂය තුළ අයකරගත් ණය	(1,573,750.00)	(521,018.25)
වර්ෂය අවසානයේ ශේෂය	**3,917,500.00**	**2,603,033.50**
සටහන 15.1 - ලැබිය යුතු කෙටිකාලීන ණය		
වර්ෂය ආරම්භයේ ශේෂය	-	-
වර්ෂය තුළ ලබා දුන් ණය	830,000.00	-
	830,000.00	-
වර්ෂය තුළ අයකරගත් ණය	(375,000.00)	-
වර්ෂය අවසානයේ ශේෂය	455,000.00	-

සටහන 16 - දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ

	මෝටර් රථ	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	කාර්යාල උපකරණ	පරිගණක උපකරණ	පුස්තකාල පොත්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය / ප්‍රත්‍යාගණනය						
2022 ජනවාරි 01 දිනට ශේෂය	**10,541,000.00**	**2,731,313.96**	**5,650,693.84**	**5,137,753.00**	**335,825.66**	**24,396,586.46**
එකතුකිරීම්	-	-	2,042,340.00	384,427.50	300.00	**2,427,067.50**
බැහැර කිරීම්/ කපාහැරීම්	-	-	-	-	-	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,541,000.00**	**2,731,313.96**	**7,693,033.84**	**5,522,180.50**	**336,125.66**	**26,823,653.96**
සමුච්චිත ක්ෂය						
2022 ජනවාරි 31 දිනට ශේෂය	**9,487,700.00**	**1,399,104.12**	**3,497,351.31**	**1,528,687.21**	**142,107.33**	**16,054,949.97**
ආරම්භක ශේෂය ගැලපීම	-	(2,148.01)	-		-	**(2,148.01)**
Revaluation **	-	-	-		-	-
වර්ෂය සඳහා	57,950.00	506,108.27	1,005,159.10	902,881.24	58,883.13	**2,530,981.74**
කපාහැරීම්	-	-	-		-	-
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**9,545,650.00**	**1,903,064.38**	**4,502,510.41**	**2,431,568.45**	**200,990.46**	**18,583,783.70**
පවතින වටිනාකම						
2022 ජනවාරි 01 දිනට	**1,053,300.00**	**1,332,209.84**	**2,153,342.53**	**3,609,065.79**	**193,718.33**	**8,341,636.49**
2022 දෙසැම්බර් 31 දිනට	**995,350.00**	**828,249.58**	**3,190,523.43**	**3,090,612.05**	**135,135.20**	**8,239,870.26**

	2022	2021
	රු.	රු.
සටහන 17 - ආයෝජන - ඉතුරුම් ගිණුම් (අරමුදල් සඳහා)		
මහජන බැංකුව - ණය අරමුදල	4,239,588.99	1,885,273.09
මහජන බැංකුව - පර්යේෂණ අරමුදල	-	3,955,565.93
	4,239,588.99	**5,840,839.02**
සටහන 18 - උපචිත වියදම්		
අනියම් සේවක දීමනා	-	21,048.44
අතිකාල	54,252.95	59,071.41
ජල ගාස්තු	7,487.21	5,655.50
දුරකථන	19,172.13	19,072.56
විගණන ගාස්තු 2021	-	646,800.00
විගණන ගාස්තු 2022	654,000.00	646,800.00
ඩිප්ලෝමා දැන්වීම්	1,825.76	-
	736,738.05	1,398,447.91
	-	-
සටහන 19 - සේවක ප්‍රතිලාභ		
වර්ෂය ආරම්භයේ ශේෂය	4,621,837.50	4,794,642.50
වර්ෂය තුළ ගෙවූ පාරිතෝෂික	(1,151,327.50)	(431,016.50)
	3,470,510.00	**4,363,626.00**
වර්ෂය තුළ වෙන් කිරීම් / (ඉවත්කිරීම්)	1,275,747.50	258,211.50
වර්ෂය අවසානයේ ශේෂය	**4,746,257.50**	**4,621,837.50**

සටහන 20 - සම්බන්ධිත පාර්ශ්ව සමග ගනුදෙනු

මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන අතර ඔවුන් සමග සිදු වූ ගනුදෙනු පහත පරිදි වේ.

නම	සම්බන්ධතාවය	ගනුදෙනුවේ ස්වභාවය	වටිනාකම
ආචාර්ය ටියුඩර් වීරසිංහ මහතා	අධ්‍යක්ෂක	විගණන කළමනාකරණ කමිටු රැස්වීම් ගාස්තු	180,000.00
		මාධ්‍ය සමීක්ෂා 5 ලිපි සම්පාදනය	3,000.00
		Zoom වැඩසටහන් ගාස්තු	3,000.00
		ඩිප්ලෝමා දේශන ගාස්තු	3,000.00
ගාමිණී විජේවර්ධන මහතා	අධ්‍යක්ෂක	විගණන කළමනාකරණ කමිටු රැස්වීම් ගාස්තු	12,000.00
ආරියනන්ද දොඹගහවත්ත මහතා	අධ්‍යක්ෂක	Zoom වැඩසටහන් ගාස්තු	3,000.00
		මාධ්‍ය සමීක්ෂා 5 ලිපි සම්පාදනය	3,000.00

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය
සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

	සත්‍ය	අයවැය	වෙනස	ප්‍රතිශතය
ආදායම්	රු.	රු.	රු.	%
ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන	35,200,000.00	32,700,000.00	2,500,000.00	7.65
පුවත්පත් ලියාපදිංචි ගාස්තු	532,000.00	500,000.00	32,000.00	6.40
ඡායා පිටපත් ගාස්තු	17,920.00	-	17,920.00	100.00
ප්‍රමාද ගාස්තු	136,000.00	100,000.00	36,000.00	36.00
විවිධ තැන්පතු / ආදායම්	2,135,969.30	-	2,135,969.30	100.00
පොත් අලෙවිය	(29,884.50)	30,000.00	(59,884.50)	(199.62)
ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා ආදායම	466,500.00	1,350,000.00	(883,500.00)	(65.44)
පොළී ආදායම - කාර්යමණ්ඩල ණය	137,483.50	120,000.00	17,483.50	14.57
පොළී ආදායම - ඉතුරුම් ගිණුම	117,516.47	100,000.00	17,516.47	17.52
මුළු ආදායම	**38,713,504.77**	**34,900,000.00**	**3,813,504.77**	
වියදම්				
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ	23,923,160.11	22,200,000.00	1,723,160.11	7.76
සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	794,756.68	1,139,000.00	(344,243.32)	(30.22)
දේපළ පිරියත සහ උපකරණ ක්ෂයවීම්,	2,530,981.74	-	2,530,981.74	100.00
උපයෝගිතා වියදම්	5,983,693.13	6,056,000.00	(72,306.87)	(1.19)
වෙනත් මෙහෙයුම් වියදම්	2,640,847.14	2,916,000.00	(275,152.86)	(9.44)
ප්‍රදාන සහ හුවමාරු ගෙවීම්	1,186,793.70	2,589,000.00	(1,402,206.30)	(54.16)
මුළු වියදම්	**37,060,232.50**	**34,900,000.00**	**2,160,232.50**	**6.19**

සටහන් 22 අයවැය හා සත්‍ය වියදම් සැසඳුම් ප්‍රකාශය

	සත්‍ය	අයවැය	වෙනස	ප්‍රතිශතය
	රු.	රු.	රු.	%
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ				
වැටුප්, සහ වේතන	16,575,396.05	15,749,840.00	825,556.05	5.24
සේ.අ.අරමුදල් දායකත්වය	1,772,196.90	2,031,960.00	(259,763.10)	(12.78)
සේ.භා.අරමුදල් දායකත්වය	354,439.40	406,000.00	(51,560.60)	(12.70)
අතිකාල සහ නිවාඩු දින වැටුප්	449,398.90	660,000.00	(210,601.10)	(31.91)
අධ්‍යක්ෂක මණ්ඩල දීමනා	786,000.00	1,008,000.00	(222,000.00)	(22.02)
පාරිතෝෂික ප්‍රතිපාදන	1,275,747.50	-	1,275,747.50	100.00
විගණන කමිටු රැස්වීම් ගාස්තු	87,092.00	120,000.00	(32,908.00)	(27.42)
වෙනත් දීමනා	35,200.91	240,000.00	(204,799.09)	(85.33)
ඉන්ධන දීමනා	1,168,688.45	565,200.00	603,488.45	106.77
ප්‍රවාහන දීමනා	1,200,000.00	1,200,000.00	-	-
දුරකතන දීමනා	219,000.00	219,000.00	-	-
	23,923,160.11	**22,200,000.00**	**1,723,160.11**	**7.76**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය
සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

සැපයුම් සහ අවශ්‍යතා	**සත්‍ය**	**උයවැය (මුල්‍ය)**	**වෙනස**	**ප්‍රතිශතය**
	රු.	**රු.**	**රු.**	**%**
ලිපිද්‍රව්‍ය	50,785.55	250,000.00	(199,214.45)	(79.69)
ඉන්ධන දීමනාව	396,447.55	548,000.00	(151,552.45)	(27.66)
කාර්යාල අවශ්‍යතා	181,513.58	250,000.00	(68,486.42)	(27.39)
නිල ඇඳුම්	12,000.00	16,000.00	(4,000.00)	(25.00)
පුවත්පත් සහ වාර සඟරා	154,010.00	60,000.00	94,010.00	156.68
යාන්ත්‍රික හා විදුලි උපකරණ		15,000.00	(15,000.00)	(100.00)
	794,756.68	**1,139,000.00**	**(344,243.32)**	**(30.22)**
උපයෝගිතා වියදම්				
දුරකතන ගාස්තු	198,435.14	225,000.00	(26,564.86)	(11.81)
තැපැල්	27,355.00	60,000.00	(32,645.00)	(54.41)
විදුලිය	596,433.33	720,000.00	(123,566.67)	(17.16)
කාර්යාල කුළී	4,026,000.00	4,026,000.00	-	-
ජල ගාස්තු	154,130.16	110,000.00	44,130.16	40.12
ආරක්ෂක වියදම්	840,814.50	850,000.00	(9,185.50)	(1.08)
අනුපාත හා බදු	140,525.00	65,000.00	75,525.00	100.00
	5,983,693.13	**6,056,000.00**	**(72,306.87)**	**(1.19)**
වෙනත් මෙහෙයුම් වියදම්				
ගමන් වියදම් - නිලධාරී	570.00	15,000.00	(14,430.00)	(96.20)
ගමන් වියදම් - සාමාජික	95,688.00	150,000.00	(54,312.00)	(36.21)
දැන්වීම් සහ ප්‍රකාශන	27,424.60	150,000.00	(122,575.40)	(81.72)
මුද්‍රණ සහ පොත් බැඳීම්	53,571.63	180,000.00	(126,428.37)	(70.24)
අළුත්වැඩියා සහ නඩත්තු	1,219,269.70	1,000,000.00	219,269.70	21.93
සංග්‍රහ වියදම්	234,103.25	220,000.00	14,103.25	6.41
තාක්ෂණික ඇගයීම් කමිටු දීමනා	480.00	8,000.00	(7,520.00)	(94.00)
පරිවර්තන	10,065.00	30,000.00	(19,935.00)	(66.45)
		-		#DIV/0!
පොත් තොග කපා හැරීම්	76,384.00		76,384.00	-
විගණන ගාස්තු	654,000.00	646,000.00	8,000.00	1.24
අනියම් වියදම්	8,900.00	200,000.00	(191,100.00)	(95.55)
බැංකු ගාස්තු	2,770.00	30,000.00	(27,230.00)	(90.77)
මෝටර් රථ රක්ෂණ සහ බලපත්‍ර	187,120.96	220,000.00	(32,879.04)	(14.95)
නීති ගාස්තු	42,000.00	42,000.00	-	-
වෙබ් අඩවි වියදම්	28,500.00	25,000.00	3,500.00	14.00
	-	-	-	-
	2,640,847.14	**2,916,000.00**	**(275,152.86)**	**(9.44)**

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

ප්‍රදාන සහ මාරුකිරීම්	**සත්‍ය**	**අයවැය (මූල්‍ය)**	**වෙනස**	**ප්‍රතිශතය**
	රු.	**රු.**	**රු.**	**%**
පළාත් සන්නිවේදන වැඩමුළුව	82,400.00	250,000.00	(167,600.00)	(67.04)
ඩිප්ලෝමා පාඨමාලාව	742,527.91	1,050,000.00	(307,472.09)	(29.28)
සහතික පත්‍ර පාඨමාලාව	172,465.76	400,000.00	(227,534.24)	(56.88)
ප්‍රකාශන හා පර්යේෂණ	63,146.00	600,000.00	(536,854.00)	(89.48)
වෙනත් වැඩසටහන්	9,370.00	216,000.00	(206,630.00)	(95.66)
සුහුණු පාඨමාලාව - නිලධාරි	-	50,000.00	(50,000.00)	(100.00)
සංනිවේදන කතිකාවත	81,464.00	23,000.00	58,464.00	100.00
පරිත්‍යාග	35,420.03	-	35,420.03	100.00
	1,186,793.70	**2,589,000.00**	**(1,402,206.30)**	**(54.16)**

සටහන් අංක 23 - වාර්ෂික අයවැය සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ අයවැය උපචිත පදනම මත සකස් කර ඇත.

සටහන් අංක 24 - අයවැයගත ආදායම් හා වියදම් අතර ප්‍රධාන විචලනයන්ට හේතු

ආදායම්

පොත් විකුණුම් ආදායම්

පොත් විකුණුම් ආදායම් අයවැයගත ආදායම් හා සසඳන විට 199.62%ක අහිතකර විචලනයක් පෙන්නුම් කරයි. මණ්ඩලයේ ප්‍රකාශන විවිධ වට්ටම් හා මිල ගණන යටතේ විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත ලබා දීම මෙම අහිතකර විචලනයට හේතු විය.

ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලාව ආදායම්

අයවැයගත ඩිප්ලෝමා සහ සහතික පත්‍ර ආදායම් සත්‍ය ආදායම සමග සැසඳීමේදී 65.44% ක අහිතකර විචලනයක් පෙන්නුම් කරයි. එසේම සහතික පත්‍ර පාඨමාලා ආදායම අයවැයගත කල නමුත් එම පාඨමාලාව ආරම්භ කිරීමට නොහැකිවීම හා රට තුළ පැවැති ආර්ථික අර්බුදය මත සිසුන් පාඨමාලාව අතරමග නතර කිරීමද මෙයට ප්‍රධාන හේතු විය.

වියදම්

වැටුප් හා චේතන

වැටුප් හා චේතන වියදම් අයවැයගත වියදම් සමග සැසඳීමේදී 5.24% ක අහිතකර විචලනයක් පෙන්නුම් අයවැයගත වියදමට ඇතුළත් කර නොමැති රාජ්‍ය සේවකයන් සඳහා රු 5,000,00 ක විශේෂ දීමනාවක් ගෙවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

අයවැය හා සසඳන විට පාරිතෝෂික වියදම්වල 100%ක අහිතකර විචලතාවයක් ඇත. අනපේක්ෂිත ලෙස සේවකයන් තිදෙනෙකු සේවයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඔවුන් හට සේවා පාරිතෝෂික ගෙවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

ඉන්ධන දීමනා

අයවැය හා සසඳන විට ඉන්ධන දීමනා වියදම්වල 106% ක අහිතකර විචලතාවයක් ඇත.
ඉන්ධන මිල ගණන් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

පුවත්පත් හා සඟරා

අයවැය හා සසඳන විට පුවත්පත් හා සඟරා වියදම් වල 156.68% ක අහිතකර විචලතාවයක් ඇත.
පුවත්පත් හා සඟරා මිල ගණන් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

ජල ගාස්තු

අයවැය හා සසඳන විට ජලගාස්තු වියදම්වල 40.2% ක අහිතකර විචලතාවයක් ඇත.
ජල බිල්පත්වල මිල ගණන් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

අළුත්වැඩියා හා නඩත්තු වියදම්

අයවැය හා සසඳන විට අළුත්වැඩියා හා නඩත්තු වියදම්වල 21.93% ක අහිතකර විචලතාවයක් ඇත.
රටෙහි පැවැති මූල්‍ය අර්බුදය හේතුවෙන් සියලුම සේවා හා අමතර කොටස් මිල ඉහල යාම මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එජ්එම්/සී/එස්එල්පීසී/3/22/එෆ්ඒ-1

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 මැයි 25 දින

සභාපති
ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 47 ඡේදය ප්‍රකාරව සහ මණ්ඩලයේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව, මෝටර් රථ වාහන ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද, පිරිවැය රු.10,541,000 ක් වූ මෝටර් රථ වාහන පිරිවැය වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන **මණ්ඩලයේ** 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, **මණ්ඩලය** අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය **මණ්ඩලය** ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා **මණ්ඩලයේ** අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සහ මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය

තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලය යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනත් 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2020 ඔක්තෝබර් 05 දිනැති 20/1468/340/002 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ 16.46 (i) (ඇ) ඡේදය.	අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මණ්ඩලයේ සභාපතිවරයාට විශ්ව විද්‍යාල ආචාර්ය තනතුරට හිමි වැටුප සහ දීමනා ගෙවිය හැකිව තිබිය දී එම ප්‍රතිලාභවලට අමතරව මණ්ඩලයේ සභාපතිවරයාට හිමි 2022 වර්ෂයේ වැටුප ලෙස රු.1,079,032 ක්ද අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ගෙවා තිබුණි.
(ආ) 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල ලිපියේ 01 ඡේදය සහ පොදු ව්‍යාපාර කාරක සභාවේ 2012 ජූලි 10 දිනැති අංක 07 නියෝගය.	මණ්ඩලය රජයේ ගොඩනැගිල්ලක පවත්වාගෙන යායුතු වුවද, මණ්ඩලය ආරම්භයේ සිට වසර 23 ක පමණ කාලයක් කුලියට ලබාගත් පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන ගොස් තිබුණු අතර, ඒ වෙනුවෙන් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගොඩනැගිලි කුලී වශයෙන් රු.33,794,800 ක් වැය කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(අ) පුවත්පත් මණ්ඩල පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව පුවත්පත් වලට හා කර්තෘවරුන් ආදීන්ට විරුද්ධව මණ්ඩලය විසින් ක්‍රියා කිරීම.	සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රවෘත්ති පත්‍ර වලට විරුද්ධව මහජනතාව සහ විවිධ ආයතන වලින් ලද පැමිණිලි 34 ක් සහ 2021 වර්ෂයේ නොවිසඳී ඉදිරියට ගෙනා පැමිණිලි 35 ක් ද ඇතුළුව මුළු පැමිණිලි සංඛ්‍යාව 69 ක් වූ අතර ඉන් පැමිණිලි 23 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විමර්ශනය වෙමින් පැවතුණි.
(ආ) පුවත්පත් මණ්ඩල පනතේ 30 වන වගන්තිය ප්‍රකාරව රීති හා නියෝග සම්පාදනය.	ලියාපදිංචි නොකර වෙළඳපලට නිකුත් කරන පුවත්පත් සම්බන්ධව කටයුතු කිරීමට අවශ්‍ය රීති හා නියෝග සම්පාදනයට ක්‍රියා කර නොතිබුණි.

(ඇ) 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව පුවත්පත් ලියාපදිංචි කිරීම් හා එසේ ලියාපදිංචි කිරීම් වෙනුවෙන් ගාස්තු අයකිරීම සඳහා ද නියෝග සැදීම.

තාක්ෂණික දියුණුවත් සමග e-පුවත්පත් ප්‍රකාශනය ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර එම පුවත්පත් ලියාපදිංචිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සංශෝධනය කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව;

2.3 වෙනත් කරුණු

(අ) 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනා ගන්නා ලද පරිසණක 02 ක ඌනතාවය හා 2022 වර්ෂයේදී හඳුනා ගන්නා ලද පරිසණක 01 ක ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි අදාළ පරික්ෂණ පවත්වා අලාභය අයකර ගැනීමට 2023 මාර්තු දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) 2021 හා 2022 වර්ෂවලදී මිලදී ගෙන තිබූ රු.299,168 ක් හා රු.384,427 ක් වටිනාකම් වූ පරිගණක යන්ත්‍ර 02 ක් භෞතික පරීක්ෂාව සිදු කරන ලද දින වන විටත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්කාර්යව පැවතුණි. එම පරිගණක මිලදී ගැනීමේදී දෘඩාංග හා මෘදුකාංග කොටස් සඳහා ලබා දී තිබූ වගකීම් කාලය ද (Warranty) අවසන් වීම, පරිගණක භාවිතයට නොගැනීම නිසා පසුව ඇතිවන දෝෂ සඳහා වන පිරිවැය මණ්ඩලයට දැරීමට සිදුවිය හැකි බවද නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.ජී.සී. වික්‍රමරත්න
විගණකාධිපති